# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## අටවන පාඩම

## නිර්මාණය කරන ලද පෙළට උචිත වේෂ භූෂණ

- වේෂභූෂණ යනු නළු නිළියන් රංගනයේ දී භාවිත කරන ඇඳුම් පැළඳුම් ය. මේවා මගින් නළුවා වෙස් වලා ගැනීම සිදු කරයි. නළුවා රූපණයේ දී තම චරිතය වඩාත් හොඳින් සිදු කිරීමට බාහිරින් එක් කර ගන්නා මෙම වේෂභූෂණ ප්‍රයෝජනයට ගනී. මූලික වශයෙන් ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට වේෂභූෂණ උපකාරී වේ.

- සාමාන්‍ය ජීවිතයේදී භාවිත කරනු ලබන වස්ත්‍ර හා ආභරණවලට වඩා වේෂභූෂණ වෙනස් වේ. එයට හේතු කීපයක් තිබේ. සාමාන්‍ය ඇඳුම ඇඳගත් අය අප සමීපයේ සිටින බැවින් එම ඇඳුම්වල සියුම් ලක්ෂණයන් පෙනුනත් වේදිකාවේ සිටින නළුවා/නළිය හැඳ සිටින ඇඳුමේ සියුම් වෙනස්කම් ප්‍රේක්ෂාගාරයේ සිටින අපට නොපෙනේ. එම නිසා රෙදිවල වටිනාකම හෝ තත්ත්වය වැදගත් නොවේ. නාට්‍යයක සිදුවන්නේ බොහෝවිට මවාපෑමක් වන බැවින් වේෂභූෂණ නිර්මාණය වී ඇත්තේ ද බාහිර පෙනුම සඳහා පමණි. රංග භූමියක් මත දැඩි විදුලි ආලෝකයක් පතිත වන නිසා එම ආලෝකයට ප්‍රතික්‍රියා නොකරන අමුද්‍රව්‍යයකින් ඇඳුම් පැළඳුම් නිර්මාණය කිරීම තවත් විශේෂත්වයකි. රංග වස්ත්‍රවල වර්ණය ද නාට්‍යයේ පසුතල දර්ශණවල වර්ණයන්ට ගැලැපෙන පරිදි සකස් විය යුතු ය.

<u>වේෂභූෂණ නිර්මාණයේ දී පහත සඳහන් කරුණු කෙරෙහි ද සැලකිල්ලක් දැක්විය යුතු ය.</u>

- වේෂභූෂණ ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් සකස් විය යුතු ය.
- ඒ ඒ පෙළ සඳහා අදාළ කාලයට , දේශයට, යුගයට ගැලපෙන ලෙසින් වේෂභූෂණ නිර්මාණය කළ යුතු ය.
- රගපෑමේ දී එම වස්ත්‍රවලින්, ආභරණවලින් අපහසුවක් ඇති නොවන පරිදි සකස් විය යුතු ය.
- නාට්‍ය පෙළෙහි දැක්වෙන චරිතවලට වඩාත් ම උචිත විය යුතුය
- වේෂභූෂණ හැකිතාත් සැහැල්ලු සහ සරල විය යුතු ය
- නළුවාට හෝ නිළියන්ට අපහසුතාවකින් තොරව ඇඳ පැළඳ ගැනීමේ හැකියාව


<u>වේෂභූෂණ නිර්මාණය කරමු</u> :

- ඉන හැඩය (ඉන හැඩය යනු රාජ ආභරණ කට්ටලයේ ඇඳුමට අවශ්‍යවන ඉන සැරසිල්ලකි.)

❖ අවශ්‍ය ද්‍රව්‍ය

- කාඩ්බෝඩ්
- කෝඩ් නූල්
- විවිධ ප්‍රමාණවල බොත්තම් හෝ කාඩ්බෝඩ් රවුම්
- සොයාගත හැකි නම් බෝතල් මූඩි
- රතු පොප්ලින් රෙදි

සාදන ක්‍රමය



- කාඩ්බෝඩ් මේ හැඩයට කපාගන්න.
- රතු පාට පොප්ලින් රෙදිවලින් හැඩ සම්පූර්ණයෙන් ම අලවන්න.
- කෝඩ් නූල් වලින් එම හැඩ තුළ මේ ආකාරයේ සැරසීම් කරන්න. (මැදට බොත්තම් ද අලවා ගත හැක.)
- ඉනට බැඳීමට ද හැකිවන පරිදි දිගට කෝඩ් නූල් (ඝනකම්) දෙකක් ගෙන, ඒ මත ඉහත කාඩ්බෝඩ් හැඩ අලවා ගන්න. ඉදිරිපසින් එල්ලා වැටෙන ලෙසට කුඩා පියන් නූල්වල එල්විය හැක.
- එම නූල් සහ පියන්ද කාඩ්බෝඩ් හැඩ ද යන සියල්ලෙහි ම ගම් ගා සිහින් වැලි හෝ ලී කුඩු දමා වියළා ගන්න පසුව අවශ්‍ය පරිදි වර්ණ කරගන්න